සන්නස

Sannasa
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel/Fax 03 9796 4241
(After 4 pm)

www.sannasa.net
www.sannasa.com

සංස්කරණය / Editors
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

සහය සංස්කාරක /Asst Editor
ශ්‍රීනාත් මද්දුමගේ
Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක / Sports Editor
අසෝක සිල්වා Asoka Silva

රූ රටා / Graphics
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

වෙළඳ දැන්වීම් / Advertising
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

Kuma Gamage
0414 215 230
email- ads.sannasa@gmail.com

Account Name - Sannasa Media
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

සන්නස පිරිවර
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වී ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

සම්බන්ධීකරණය

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත



වෙසක්

සුදු සඳ නැගෙන පැහැබර නුබ	තලාවයි
මොහඳුර පියෙන් පිය මැන යන	කලාවයි
බොදු බැති ගුණය රැඳි සදහම්	ගුලාවයි
වෙසගෙහි මහිම ලොව සරසන	වෙලාවයි

ජගත් වෙත්තසිංහ

දස වසරක සන්නස

සන්නසට වසර දහයක් පිරීම නිමිත්තෙන් සටහනක් ලියන්නට අවස්ථාව ලැබීම ඉමහත් සතුටකි. එය මා ලියන්නේ සන්නසේ මුල්ම නවකතාව ලියන්දී මා ලැබූ සතුට තරම් ම වූ සතුටකිනි.

වයසින් මෙන්ම කලාත්මකබවින් ද, ගුණාත්මකබවින් ද මුහුකුරා යන්නට සන්නසට හැකිවෙයැයි විශ්වාසයක් මීට වසර දහයකට පෙර දී මා තුළ විය. එය නුදු ප්‍රාර්ථනාවක් පමණක් ම නොවන බවට දෙස් දෙන්නට අද සන්නසට හැකි වී ඇත.

විදේශයක නුපුරුදු අදහස් උදහස් අතර අප නුදකලා වූ විටෙක එය අප තර්කයෙන් කුළුගන්වා ඇත්තේය. විදෙස් බසක ඔරොත්තු නොදෙන තීරසකින් අප පෙළෙන්නට වූ විටෙක එය අප මව් බසේ දයා දියෙන් නහවා ඇත්තේය. මානසික විකලත්වය කලාත්මක සම්භවයකැයි අඳහන්නට නුනුරු සමාජය අපව පොළඹවන විට මනුශ්‍යත්වයේ ගුණ සුවඳින් එය අප සිත් මල පුබුදුවා ඇත්තේය. සන්නස මෙතෙක් කල කී දෑ අතරට අලුතින් කල යුතු සහ කළ හැකි දෑ එකතුවන්නටත්, තවත් දිගු දස වසර ගණනාවක් පසුකර යන්නටත් ශක්තිය සහ ධෛර්යය ලැබේවා යන්න මගේ පැතුමයි!

විද්‍යානි මනතුංග

පෙරගමන් කරුවා ඔබයි

සන්නස ඕස්ට්‍රේලියාවේ පළවන ශ්‍රී ලාංකික පුවත්පත් අතර සුවිශේෂී තැනක් හිමිකර ගත් පුවත්පත බව අවිවාදිතයි. වෙලාවකට සන්නස ගින්දර වගේ උණුසුම් තවත් වෙලාවකට කරුණාවේ සිසිලසින් පිරිලා. පත්තරයකින් අපි බලා පොරොත්තු වෙන්නෙ ඒ ජීවමය ගතියයි ඒ අතින් සන්නස පෙරමුණේ.

දස වසරක කාලයක් තුළ සන්නස අපේ සමාජයට කරපු මෙහෙය අපට අමතක නැතැ. අපේ සමිති සමාගම් වලට සන්නස කොයි තරම් උදව් කර තියෙනවද? අපි හොඳටම දන්න දෙයක් තමයි සන්නස කවදාකවත් මුදල ඉස්සරහට කරගත්තෙ නැති බව.

සන්නසට තවත් ඉදිරියටම යන්නට ආසිරි පතමි

සුදර්ශණ ජයමහ

පිබිදෙන මෙල්බන් වේදිකාව

මෙයට දස වසරකට එහා අතීතයේදී මෙල්බන් නගරයේ විවිධ ඉසවු වලින් විවිධ කලාත්මක නිර්මාණ බිහිවෙමින් තිබූ ආකාරය අපට මතක ඇත්තේ ඒ කලා ප්‍රබෝධය අපේ සිත් වලද සතුටක් ඇති කළ නිසාය. නැවුම් අදහස් වලින් පෝෂිත වූ විවිධ ප්‍රසංග, වේදිකා නාට්‍ය, ගීත ගායනා ප්‍රසංග මේ පුරවරයෙන් බිහිවෙමින් තිබුණි. ඒ සියල්ල සැළසුම් කළේ ඉදිරිපත් කරන ලද්දේ අපේ සමාජයේ අප සමගින් එකට සිටින දක්ෂයන් විසිනි. අපි එදා ඔවුන් අගය කළෙමු.

එහෙත් මොකක්දෝ අභාග්‍යයකට ඒ සියල්ල බලා සිටියදී වියැකී ගියේය. ලංකාවෙන් තොග ගණනින් ආයනය කෙරුණ ප්‍රසංග වලින් මෙල්බන් වේදිකා ඉඩ ඇහිරී ගියේය. මේ ආනයනිත ප්‍රසංග වල දිස් නයෙන් නැගී එමින් තිබූ මෙපුර කලා කටයුතු සැඟවී යනු කිසිවකු නිරීක්ෂණය නොකළ බව සහතික ය.

ඒ පරිච්ඡේදයෙන් පසුව දැන් දැන් නැවතත් මෙල්බන් වේදිකාව අපේ ප්‍රසංග වලින් පිරී යන්නට පටන් ගෙන තිබීම සතුටකි. කණිෂ්ක හා තරංග වැනි තරුණ නිර්මාණකරුවන් සිය වේදිකා නාට්‍ය මේ වේදිකා මත පණ ගන්වද්දී මෙල්බන් රසිකයන් ඔවුන් වටා රොක් වනු දැක අපි සතුටට පත් වුණොමු. ඒ තරුණයන්ට ශක්තියක් වන ලෙසින් ජය ශ්‍රී චන්ද්‍රජිත් ප්‍රවීණ රංගධරයාද සෑම් විරරත්න ඇතුළු පිරිසක් සමගින් මෙල්බන් වේදිකාවේ සිය අණසක පතුරන්නට පටන් ගෙන තිබීම අප දකින සුවිසල් සාධනීය ලක්ෂණයකි.

මේ ගමන මෙතනින් නොනවත්වා තවත් ඉදිරියටම ගෙන යන්නට අපේ කලාකරුවන් වග බලා ගත යුතුය. ආනයනිත විසූක දස්සන වලින් විකෘති වී ඇති ප්‍රේක්ෂක රස විඳදනය නගා සිටුවන්නට හැකි වන්නේ එවිටය.

එසේම මේ කලාකරුවනට රසික සහය ද නොඅඩුව ලැබිය යුතුය. අපේ දේ අගය නොකරන්නෝ කුහකයෝ ය. එවන් සමාජයක් තුළ කලාව ගොඩ නැගෙන්නේ නැත. එබැවින් අපි අප සමග සිටින අපේ දක්ෂයන් අගය කරන්නටත් ඔවුන් දිරිමත් කරන්නටත් නිබඳව උත්සාහ කළ යුතුවෙමු. එය අපේ යුතුකමක් ද වෙයි.

මේ ගමන පහසු නැත. එය කටුක ය. වෙහෙසකර ය. නමුත් ඉදිරියටම යාම සඳහා අවශ්‍ය ජවය අපේ මෙල්බන් කතාකරුවන් තුළ ඇති බව අපට සහතික ය. සන්නස සැමවිටම ඔවුන් සමග ය.

සැලැ අසරණ සරණ ව්‍යාපාරයක් අවශ්‍යයි

ශ්‍රී ලංකාවේ විවිධ කලා ක්ෂෙත්‍ර වල නියැලී සිටින කලාකරුවන් හා කලාකාරියන් අකාරුණික රෝගාබාධ වලට ගොදුරු වන අවස්ථා වලදී උපකාර ඉල්ලා සන්නස අමතනු ලැබ ඇත්තේ වරක් දෙවරක් නොවේ. ආසන්නම අවස්ථාව ලංකාවේ ප්‍රකට පුවත්පත් කාලවේදිනියකගේ ශල්‍යකර්මයක් සඳහා ආධාර කරන ලෙස ලද ඉල්ලීමය. සන්නස හිතවතුන් තමන්ට හැකි පමණින් මේ අවස්ථා වලට දායක වී ඇති බවද සත්‍යයකි. නමුත් මෙවන් අකාරුණික අවස්ථා වලදී අපේ කලාකරුවනට කලාකාරියනට උපකාර කිරීමට හැකි යම්කිසි සංවිධානයක අවශ්‍යතාව අපට දැනෙමින් පවතියි.

ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව විසින් පවත්වාගෙන යනු ලබන විවිධාකාර සුබසාධන සංවිධාන ඇති බව සැබෑවකි. ඒ ඒ සංවිධාන වල ප්‍රකාශිත අරමුණු වල නම් ඇත්තේ ලංකාවේ කලාකරුවනට උදව් උපකාරි කිරීම මුල් තැනට ඇති බවය. උදව් උපකාර විවිධ ආකාර වලින් කෙරෙන බව ද සැබෑය. අවාසනාව ඒ උදව් උපකාර කෙරෙන්නේ තම තමන්ගේ හිතවතුන්ට පමණක් වීමය. "අපි ලංකාවට උපකාර කළා" කියා ගැලවෙන්නට හැකි වුවද සැබෑ ලෙසම අවශ්‍යතා ඇති කලාකරුවන් කලාකාරියන් දෙස ඇහැක් අරා බලන්නේ එහෙමත් කෙනෙකි.

අවංක හැඟීමකින් හිතවත් කම් නොබලා අවශ්‍යතා පමණක් සැළකිල්ලට ගනිමින් ආධාර කළ හැකි සංවිධානයක් අපට අවශ්‍ය ය. මේ වෙනුවෙන් මහා විශාල ධනයක් වැය කරන්නට අවශ්‍ය නැත. එදිනෙදා කෑමට බීමට නාස්ති කරන පාටි දමන්නට නාස්ති කරන මුදල පොදු අරමුදලකට එක් කළ හොත් අවශ්‍යතා ඇති සිය ගණනකට වසරකදී උපකාර කළ හැකි ය. දැන් අපට අවශ්‍ය වන්නේ එවන් සංවිධානයක් සඳහා පෙරමුණ ගන්නා නායකයන් කීපදෙනකු පමණකි.

එවන් සංවිධානයක් ගොඩ නැගෙන්නේ නස් සන්නස ද අනිවාර්යයෙන් ඔවුන් සමග අත්වැල් බැඳ ගන්නට සූදානම් ය.